# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2255/16 – 2021 නොවැම්බර් මස 24 වැනි බදාදා – 2021.11.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

2007/01/25 දිනේෂ් චන්ද්‍ර ගුණවර්ධන, අමාත්‍ය (නාගරික සංවර්ධන සහ ජල සම්පාදන) ලෙස 269 වන අධිකාරය වූ නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනතේ 6(2) (ආ) සහ 21 (2) වගන්ති යටතේ "සිතුල් පව්ව නාගරික බල ප්‍රදේශය" ලෙස නම් වූ බල ප්‍රදේශයම, මින් මතුව "සිතුල්පව්ව පූජා භූමිය" ලෙස නම් කරන්නාවූ *ගැසට්* පත්‍රයයි.

**හම්බන්තොට දිස්ත්‍රික්කයේ යාල වන උද්‍යානයේ පිහිටි ඓතිහාසික සිතුල්පව්ව රජමහා විහාරයට අයත් පූජනීය ප්‍රදේශය, පූජාභූමියක් ලෙස ප්‍රකාශයට පත් කිරීම**

අංක 2148/42 හා 2020 අගෝස්තු මස 13 වැනි බ්‍රහස්පතින්දා *අතිවිශේෂ ගැසට්* පත්‍රයේ පළකරන ලද නියමය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2148/42 හා 2020 අගෝස්තු මස 13 වැනි බ්‍රහස්පතින්දා ප්‍රසිද්ධ කරන ලද *අතිවිශේෂ ගැසට්* පත්‍රය මගින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා විසින් කරන ලද නිවේදනය පරිදි බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මා හට පැවරී ඇති බුද්ධ ශාසන විෂය යටතේ වන, පූජාභූමි සංරක්ෂණය හා සංවර්ධනය කිරීමේ අනු විෂය ප්‍රකාරව මෙහි උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන ඉඩම් ප්‍රදේශයේ චිරාත් කාලීන සුරක්ෂිත බව සඳහා එම ප්‍රදේශය පූජනීය ප්‍රදේශයක් බවටත් එය, **"ඓතිහාසික සිතුල්පව්ව රාජමහා විහාර පූජාභූමිය"** යනුවෙන් හඳුන්වනු ලැබිය හැකි බවටත් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

මහින්ද රාජපක්ෂ,
බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍ය.

2021 නොවැම්බර් මස 23 වැනි දින,
බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය,
අංක 135, අනගාරික ධර්මපාල මාවත,
කොළඹ 07.

1A – G 35413 – 15 (2021/11)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

උපලේඛනය

**ඓතිහාසික සිතුල්පව්ව රජමහා විහාර පූජාභූමිය සංයුක්ත වන ප්‍රදේශය**

දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මාගම් පත්තුවේ පලටුපාන ග්‍රාමයේ සිතුල්පව්ව රාජමහා විහාරය අයත් සහ සර්වේ ජනරාල්ගේ 2004.12.03 දිනැති අංක එච්/ටීඑස්එස් 2004/841 දරන පිඹුරේ ඇතුලත් පහත දැක්වෙන මායිම්වලින් වට වූ මුළු ප්‍රදේශය:-

බස්නාහිරට: සර්වේ ජනරාල්ගේ අංක එච්/ටීඑස්එස් 2004/841 අනුරේඛණයේ කැබලි අංක 32 දරන ඉඩමේ දකුණ හා බස්නාහිර මායිම් හමුවන ස්ථානය ආරම්භක ලක්ෂ්‍යය වේ. එතැන් සිට එකී කැබලි අංක 32 දරන ඉඩමේ, බස්නාහිර මායිම දිගේ පිළිවෙලින් මීටර් 848 ක් උතුරු දිශාවටද, ඊශාන, වයඹ, නැවත උතුරු, නැගෙනහිර නැවත ඊශාන සහ නැවත වයඹ දිශාවට කැබලි අංක 30 දරන ඉඩමේ දකුණු හා බස්නාහිර මායිම් ද, කටගමුව මාවතේ දකුණු පස මායිම හමු වන ස්ථානය දක්වාද, එතැන්සිට කැබලි අංක 30 දරන එකී ඉඩමේ බස්නාහිර මායිම දිගේ මීටර් 16 ක දුරක් වයඹ දිශාවට කටගමුව මාවත හරහා එකී මාවතේ වම් පස මායිම සහ කැබලි අංක 24 දරන ඉඩමේ දකුණු සහ බස්නාහිර මායිම් හමුවන ස්ථානය දක්වාද, එතැන් සිට එකී කැබලි අංක 24 දරන ඉඩමේ බස්නාහිර මායිම දිගේ මීටර් 336 ක් ඊශාන දිශාවට ද;

උතුරට: බස්නාහිර මායිමේ අවසාන ලක්ෂ්‍යයේ සිට කැබලි අංක 24 දරන එකී ඉඩමේ උතුරු මායිම දිගේ මීටර් 552 ක දුරක් පිළිවෙලින් ඊශාන සහ ගිනිකොණ දිශාවටද;

නැගෙනහිරට: උතුරු මායිමේ අවසාන ලක්ෂ්‍යයේ සිට කැබලි අංක 24 දරන ඉඩමේ නැගෙනහිර මායිම දිගේ මීටර් 620 ක දුරක් පිළිවෙලින් ගිනිකොණ සහ නිරිත දිශාවට, කැබලි අංක 33 දරන ඉඩමේ උතුරු හා නැගෙනහිර මායිම හමුවන ස්ථානය දක්වාද, එතැන් සිට එකී කැබලි අංක 33 දරන ඉඩමේ නැගෙනහිර මායිම දිගේ මීටර් 300 ක් නිරිත දිශාවට එකී ඉඩමේ නැගෙනහිර හා දකුණු මායිම් හමුවන ස්ථානය දක්වාද;

දකුණට: නැගෙනහිර මායිමේ අවසාන ලක්ෂ්‍යයේ සිට කැබලි අංක 33 දරන ඉඩමේ දකුණු මායිම දිගේ මීටර් 336 නිරිත දිශාවට කතරගම යෝධකන්ඩිය මාර්ගයේ දකුණු පස මායිම හමුවන තෙක්ද එතැන්සිට එකී මාර්ගය හරහා කැබලි අංක 31 දරන ඉඩමේ දකුණු මායිම දිගේ මීටර් 16ක් වයඹ දිශාවට ඉහත කී මාර්ගයේ වම්පස මායිම සහ කැබලි අංක 32 දරන ඉඩමේ දකුණු නැගෙනහිර මායිම් හමුවන තෙක්ද එතැන්සිට කැබලි අංක 32 දරන ඉඩමේ දකුණු මායිම දිගේ මීටර් 104 ක දුරක් පිළිවෙලින් වයඹ සහ නිරිත දිශාවේදී ආරම්භක ලක්ෂ්‍ය හමුවන තෙක්ද වේ.

12 - 103

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.